*සැ. යු.* - *මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.*

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,730 - 2011 ඔක්තෝබර් මස 28 වැනි සිකුරාදා - 2011.10.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1658 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1659 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1666 |

*සැ. යු.*- ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය (සංශෝධන) පනත් කෙටුම්පත 2011 සැප්තැම්බර් මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 නොවැම්බර් මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ඔක්තෝබර් මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා අකුරැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| කාර්යාල කාර්ය සහායක | 02 | රා.ප.ච. 6/2006 (iv)PL- 1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | අවම වශයෙන් 08 ශ්‍රේණිය , 09 ශ්‍රේණිය /සමත් වී තිබීම. |

01. *පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුයි.
(ii) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුයි.
(iii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුයි.
(iv) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුයි.
(v) අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ දැනට සේවය කරන අය සඳහා ප්‍රමුඛස්ථානය ලබාදෙනු ලැබේ.

02. බඳවා ගැනීමේ ක්‍රමය :

c සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ.
(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.
(ii) වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට දායකත්වය හිමිවේ.
(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

04. *ඉල්ලුම් කරනු ලබන ආකාරය :*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරන ලද (A 4 ප්‍රමාණයේ)අයදුම්පත් 2011.11.29 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "සභාපති, අකුරැස්ස ප්‍රාදේශීය සභාව අකුරැස්ස" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ ඉල්ලන තනතුරේ නාමය සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී, මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල සභාපති,අකුරැස්ස ප්‍රාදේශීය සභාව සතුවේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

01. උප්පැන්න සහතිකය,
02. අධ්‍යාපන සහතික,
03. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
04. මෑතකදී ලබාගත් ග්‍රාම සේවා සහතිකය,
05. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්,
06. පළපුරුද්ද පිළිබඳ සහතිකය.

එස්. එල්. සුනිල්,
සභාපති,
අකරුස්ස ප්‍රාදේශීය සභාව.

2011 ඔක්තෝබර් මස 07 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

............................................................... *තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :——————————.
    (i) මුලකුරු වලින් හැඳින්වෙන නම:——————————.
02. තැපැල් ලිපිනය :——————————.
03. උපන් දිනය:
    වර්ෂය:—————— . මාසය:—————— . දිනය:—————— .
04. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
05. අයදුම්පත් භාර ගන්නා දිනට වයස :——————————.
    අවුරුදු:—————— . මාස:—————— . දින:—————— .
06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
07. විවාහක/අවිවාහක බව:——————————.
08. ජාතිය :——————————.
09. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද, එසේ නම් පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————.
10. අධ්‍යාපනික සුදුසුකම් :——————————.
11. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සෙකු වන බවත්, පත් වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දන්වමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

10-581

# පළාත් පාලන නිවේදන

## මහර ප්‍රාදේශීය සභාව

### 2012 වර්ෂයට සංචාරක සංවර්ධන පනතේ සඳහන් කාර්යය සඳහා 1% ක බදු මුදලක් අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය යටතේ 1968 අංක 14 දරන සංචාරක පනතේ සඳහන් කාර්යය සඳහා භාවිත කරන සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වූ හෝටලයක්, ආපනශාලාවක් හෝ නවාතැන්පලක් සඳහා පෙරාතුවම වූ අවුරුද්දේ ආදායම් අනුව එම ආදායමෙන් 1% ක ගාස්තුවක්, 2012 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

දේශබන්දු සහන් ප්‍රදීප් විතාන,
සභාපති,
මහර ප්‍රාදේශීය සභාව.

2011 ඔක්තෝබර් මස 04 වැනි දින,
මහර ප්‍රාදේශීය සභාව,
පහළ කරගහමුණ, කඩවත.

10-642/10

## පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

### වීදි නම් කිරීම

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි පහත උපලේඛනයේ නම් සඳහන් මාර්ග, වීදි, උපලේඛනයේ යෝජිත නාමය යටතේ නම් කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මත කරන ලදුව, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්ති ප්‍රකාරව ගරු පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව මාර්ගය මින් ඉදිරියට යෝජිත නාමයෙන් හැඳින්වීමට කටයුතු කරන බැව් මින් නිවේදනය කරමි.

ඕ. පී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

2011 ඔක්තෝබර් මස 04 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී ය.

**උපලේඛනය**

| | *මාර්ගය* | *යෝජිත මාර්ගය* |
|---|---|---|
| 01. | වැලිගොඩවත්ත හන්දියේ වෙරළුගස්හින්න, කටුකිතුල, ගල්පොතුයාය දක්වා මාර්ගය | දිවි පිදූ මේජර් අජිත් ගමගේ මාවත. |

10-570

**මහර ප්‍රාදේශීය සභාව**

2012 වර්ෂයට අදාලව වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියෙන් මහර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2011 වර්ෂයෙහි ඔක්තෝබර් මස 04 වැනි දින පවත්වන ලද මහර ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

දේශබන්දු සහන් ප්‍රදීප් විතාන,
සභාපති,
මහර ප්‍රාදේශීය සභාව.

2011 ඔක්තෝබර් මස 04 වැනි දින,
මහර ප්‍රාදේශීය සභාව,
පහළ කරගහමුණ, කඩවත.

**ඉහත කී යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි උපවගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මහර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල ඉඩම්වල, ගෙපත්වල 1997/1998 වාර්ෂික වටිනාකම සඳහා 1972, 1996, 1997 වර්ෂවලදී සිදු කරන ලද තක්සේරුව 2012 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී දේපල මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට 5 ක වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවටත් යෝජනා කරමි.

තව ද එකී පනතේ 134 (7) වැනි වගන්තිය ප්‍රකාර යම් වර්ෂයක වරිපනම් බද්දක් පහත සඳහන් පරිදි සම්පූර්ණයෙන් ගෙවූ විට එහි දැක්වෙන මට්ටම් ප්‍රදානය කරන බව ද වැඩිදුරටත් දැනුම් දෙනු ලැබේ. එනම් -

*(අ)* 2012 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර සම්පූර්ණ වර්ෂයටම ගෙවිය යුතු වරිපනම් බද්ද ගෙවනු ලැබුවහොත් එම මුදලින් 10% (සියයට දහයක), වට්ටමක් ද,

*(ආ)* වරිපනම් බද්ද කොටස් වශයෙන් ගෙවන විට ගෙවිය යුතු කාර්තුවේ පළමු මාසය තුල හෝ ඊට පෙර සම්පූර්ණයෙන් ගෙවනු ලැබුවහොත් එම මුදලින් 5% (සියයට පහක), වට්ටමක් ද, බදු ගෙවන්නට දෙනු ලැබේ.

නියමිත කාර්තුව තුළදී බද්ද නොගෙවන අයගේ එකී පනතේ (161)(අ) වැනි වගන්තියෙන් දක්වා ඇති ආකාරයට වරෙන්තු නිකුත් කිරීමෙන් පසුව එක් එක් කාර්තුව සඳහා හිස් බිම් හා නිවාස ස්ථාන සම්බන්ධයෙන් 15% ක, වරෙන්තු ගාස්තුවක් ද, වෙළඳ හා වාණිජ දේපළ වෙනුවෙන් 20% වරෙන්තු ගාස්තුවක් ද අය කළ යුතු යැයි යෝජනා කරමි."

10-642/4

---

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

වරිපනම් බදු අයකිරීම - 2012 වර්ෂය

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ අගෝස්තු මස 30 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 5-9-1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

*යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 උපලේඛනයේ (1) වැනි උපවගන්තියෙන් ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි වරිපනම් සීමාවට අයත් සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2012 වාර්ෂික වටිනාකම සඳහා 2004 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරුව 2012 වර්ෂය සඳහා පිළිගැනීමටත්, එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී දේපල මත ඉහත කී වාර්ෂික වටිනාකමින් 5% ක් ව්‍යාපාර ස්ථාන සඳහා ද, 4% නේවාසික ස්ථාන සඳහා ද, වරිපනම් බද්දක් 2012 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

යූ. කේ. සුමිත් වීරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2011 ඔක්තෝබර් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ දී ය.

10-666/1

---

**මහර ප්‍රාදේශීය සභාව**

2012 වර්ෂයට සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1) දරන වගන්තිය පරිදි මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යය සඳහා හෝ නිත්‍ය හෝ විධිමත් ලෙස වගා කිරීමේ කාර්යය සඳහා යෝග්‍යවන හෝ ප්‍රාදේශීය සභාවේ මතය අනුව සාධරණ යැයි සැළකෙන වියදමකින් එවැනි යම් කාර්යයක් සඳහා ඒ ඉඩම සංවර්ධනය කළහැකි වන අවස්ථාවක් ; සහ

*(අ)* ඒ ඉඩමේ කිසිම ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති වූ, හෝ

*(ආ)* සැබැවින්ම ගොඩනැගිල්ලක් ආවරණය වූ ඒ ඉඩමේ බිම් ප්‍රමාණය ඒ ඉඩමේ මුල් බිම් ප්‍රමාණයට
නියමිත සමානුපාතයට වඩා අඩු සමානුපාතයක් ප්‍රාදේශීය සභා යෝජනා සම්මතයක් මගින් දරන්නා වූ, හෝ,

*(ඇ)* ඒ ඉඩමේ විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති වූ අවස්ථාවක,

එම ඉඩමේ ප්‍රාග්ධන බිම් ප්‍රමාණයෙන් 2% ක (සියයට දෙකක) බද්දක් සංවර්ධන නොකළ ඉඩම් සඳහා වූ බදු වශයෙන් 2012 වර්ෂය සඳහා පනවා අය කළ යුතුයි යෝජනා කරමි.

දේශබන්දු සහන් ප්‍රදීප් විතාන,
සභාපති,
මහර ප්‍රාදේශීය සභාව.

2011 ඔක්තෝබර් මස 04 වැනි දින,
මහර ප්‍රාදේශීය සභාව,
පහළ කරගහමුණ, කඩවත.

10-642/7

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

2012 වර්ෂයට විනෝද බදු පැනවීම

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ අගෝස්තු මස 30 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 5-9-6 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

**යෝජනාව**

විනෝද බදු ආඥාපනතේ 2 වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ස්ථිර සිනමා ශාලා මගින් අලෙවි කරනු ලබන ටිකට්පත් වල මුළු වටිනාකමින් 7.5% ක විනෝද බද්දක් ගෙවිය යුතු බවත් තාවකාලික ප්‍රදර්ශනය කරනු ලබන ආධාර චිත්‍රපටි දර්ශන, මැජික් දර්ශන, සර්කස් දර්ශන සහ සෑම සංගීත සංදර්ශනයක් වෙනුවෙන් මුද්‍රණය කරනු ලබන ප්‍රවේශපත්‍රවල වටිනාකමින් 15% ක විනෝද බද්දක් අය කිරීම මෙයින් නිවේදනය කරනු ලැබේ.

යූ. කේ. සුමිත් වීරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2011 ඔක්තෝබර් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ දී ය.

10-666/6

---

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

ඉඩම් විකිණීම මත බදු අයකිරීම - 2012 වර්ෂය

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ අගෝස්තු මස 30 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 5-9-7 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

**යෝජනාව**

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ පාලන සීමාව තුල පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවෙකුගේ හෝ ඔහුගේ සේවකයකු හෝ නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන් ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තිය අනුව විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක සමාන බද්දක් විකුණුම්කරු හෝ සේවකයකු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයාගේ අනුයෝජිතයා විසින් ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි මෙයින් දැනුම් දෙනු ලැබේ.

යූ. කේ. සුමිත් වීරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2011 ඔක්තෝබර් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ දී ය.

10-666/7

---

**මහර ප්‍රාදේශීය සභාව**

2012 වර්ෂයට විනෝද බදු පැනවීම

26 වැනි අධිකාරය වන විනෝද බදු ආඥාපනතේ දෙවැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල මුදල් අයකර ප්‍රදර්ශනය කරනු ලබන චිත්‍රපට දර්ශන, සංගීත සංදර්ශන හෝ වෙනත් ඕනෑම විනෝද දර්ශනයක් වෙනුවෙන් එම දර්ශනය සඳහා නිකුත් කරන ප්‍රවේශ පත්‍ර වල වටිනාකමින් 20% (සියයට විස්සක) විනෝද බද්දක් 2012 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

දේශබන්දු සහන් ප්‍රදීප් විතාන,
සභාපති,
මහර ප්‍රාදේශීය සභාව.

2011 ඔක්තෝබර් මස 04 වැනි දින,
පහළ කරගහමුණ, කඩවත,
මහර ප්‍රාදේශීය සභාවේ දී ය.

10-642/9

**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**

2012 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ අගෝස්තු මස 04 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 07(ආ)VII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. කේ. කසුන්,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2011 සැප්තැම්බර් මස 07 වැනි දින,
බෙලිඅත්ත,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු, තැරැව්කරුවෙකු, ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක, එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 01%ක බද්දක් පනවා අයකළ යුතු බවටත්, එකී බද්ද ඉඩම විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

10-547/7

---

**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**

2012 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ අගෝස්තු මස 04 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 07(ආ) I යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2012 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවද, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2012 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2012 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාල වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

එම්. කේ. කසුන්,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2011 සැප්තැම්බර් මස 07 වැනි දින,
බෙලිඅත්ත,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියළුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2011 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2012 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන් සියයට දහතුනක (13%) ක වරිපනමක් 2012 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, සහ

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

10-547/1

## මාවනැල්ල ප්‍රාදේශීය සභාව

1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත

මෙහි වූ උපලේඛනයේ නම් සඳහන් තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාව එහි සඳහන් ස්ථානයේ පැවැත්වීම සඳහා 2012 වර්ෂයට බලපත්‍රයක් ලබාගැනීමට මා වෙත ඉල්ලුම්පතක් ඉදිරිපත් කර ඇති බව 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනතේ 6 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී ශාලාව අසල හෝ එකී ශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය අසල පදිංචි යම් තැනැත්තෙකු එම සමාජ ශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට සති හතරක් ඇතුළත විරුද්ධත්වයට හේතු දක්වමින් පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

බී. පී. ඉඳුනිල් ශාන්ත ගුණසේන,
සභාපති,
මාවනැල්ල ප්‍රාදේශීය සභාව.

2011 සැප්තැම්බර් මස 27 වැනි දින,
මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ දී ය.

### උපලේඛනය

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *සමාජ ශාලාවේ සභාපති ද ලේකම් ද, කළමනාකරුද යන වග* | *සමාජ ශාලාවේ නම* | *සමාජ ශාලාව පවත්වාගෙන යාමට බලාපොරොත්තු වන ස්ථානය* |
|---|---|---|---|
| එස්. ජී. විජේවර්ධන මයා අංක 21/3-වලව්වත්ත මාවනැල්ල. | ලේකම් | මාවනැල්ල විනෝද ක්‍රීඩා සමාජය | මාවනැල්ල රන්කොත්දිවල වසමේ අංක 50 දරන බණ්ඩාර වත්ත නමැති ස්ථානය |

10-562

---

## මාතර මහ නගර සභාව

2012 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වැනි අධිකාරය යටතේ මහ නගර සභා ආඥාපනත මගින් පැවරී ඇති බලතල අනුව මහ නගර සභා ආඥා පනතේ II වැනි කොටසේ 230 වන වගන්තිය යටතේ මහ නගර සභා සීමාව තුළ 2012 වර්ෂය සඳහා වරිපනම් බදු 2000 වර්ෂයේ තක්සේරු මත වෙළඳ හා වාණිජ්‍ය කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන ස්ථානයක් සඳහා 15%ක වරිපනම් බද්දක් ද අනෙකුත් දේපල සඳහා 8%ක වරිපනම් බද්දක් ද 2012 වර්ෂය සඳහා පනවා අයකිරීමට 2011.08.04 දින පැවති මහ සභාව තීරණ අංක 06:10 යටතේ ඒකමතිකව සම්මත කර ඇති බවත්, එය පහත ආකාරයට බදු අයකිරීමට තීරණය කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

01. පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් මස 31 යන දිනයන්හි දී හෝ ඊට පෙර එම බද්ද සමාන කොටස් හතරකින් ගෙවා නිම කළ හැකිය.

02. 2012 වර්ෂයට නියමිත බදු මුදල එම වර්ෂයේ ජනවාරි 31 වැනි දිනට පෙර සම්පූර්ණයෙන්ම ගෙවා නිම කරන්නේ නම් බදු මුදලින් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ බදු මුදල් ඒ ඒ කාර්තුවේ මුල් මාසය තුළ ගෙවනු ලබන්නේ නම් සියයට පහක (5%) වට්ටමක් ද ලැබීමට හිමිකම් ලැබේ.

03. ඉහත 1 වැනි ඡේදයේ සඳහන් දිනවලට පසුව කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් ඉඩම් හා වාසස්ථාන දේපල වෙනුවෙන් සියයට පහළොවක (15%) අමතර ගාස්තුවක් ද, අනෙකුත් දේපල වෙනුවෙන් සියයට විස්සක (20%) අමතර ගාස්තුවක් ද වරෙන්තු ගාස්තු වශයෙන් අයකරනු ලැබේ.

වික්ටර් පුංචිහේවා,
නාගරික කොමසාරිස්,
මාතර මහ නගර සභාව.

2011 සැප්තැම්බර් මස 14 වැනි දින,
මාතර මහ නගර සභා කාර්යාලයේ දී ය.

10-561

---

## කැස්බෑව නගර සභාව

2012 වර්ෂය සඳහා වරිපනම් බදු

(255 වැනි අධිකාරය) නගර සභා ආඥාපනතේ 160 වැනි වගන්තියෙන් කැස්බෑව නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කැස්බෑව නගර සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටි සියළුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2012 වාර්ෂික වටිනාකම සඳහා 2002 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරුව 2012 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත නගර සභා ආඥාපනතේ 160 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර

කුඹුරු ඉඩම් හා වෙළඳ හෝ වාණිජමය දේපල හැර අනෙකුත් දේපලවල එකී වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%), සහ

වෙළඳ හෝ වාණිජමය කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථානවලින් එකී වාර්ෂික වටිනාකමින් සියයට දහයක (10%)

වරිපනම් බද්දක් 2012 වර්ෂය සඳහා පනවා අය කිරීමට කැස්බෑව නගර සභාව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

02. මෙම වරිපනම් බදු පිළිවෙලින් මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 සහ දෙසැම්බර් මස 31 දින හෝ ඊට ප්‍රථම සමාන කොටස් හතරකින් හෝ සම්පූර්ණයෙන් එකවර හෝ ගෙවිය හැක.

03. 2012 වර්ෂයට නියමිත සම්පූර්ණ වරිපනම් බදු මුදල් 2012.01.31 දින හෝ ඊට පෙර ගෙවන්නේ නම් 10%ක වට්ටමක් දෙනු ලැබේ.

04. එක් එක් කාර්තුවට නියමිත මුදල අදාල කාර්තුවේ පළමු මස තුල ගෙවනු ලැබුවහොත් 5%ක වට්ටමක් දෙනු ලැබේ.

05. ඉහත 2 ඡේදයේ සඳහන් දිනයන්ට ප්‍රථම වරිපනම් බදු මුදල් ගෙවනු නොලැබුවහොත් එක් එක් කාර්තුව සඳහා ගෙවිය යුතු වරිපනම් බදු මුදලින් නේවාසික ස්ථාන සඳහා 15%ක් ද වාණිජ දේපල සඳහා 20%ක් ද වශයෙන් වරෙන්තු ගාස්තු අය කරනු ලැබේ.

ලක්ෂ්මන් පෙරේරා,
සභාපති,
කැස්බෑව නගර සභාව.

2011 ඔක්තෝබර් මස 05 වැනි දින,
කැස්බෑව නගර සභාව,
පිළියන්දල.

10-549

**කඩුවෙල මහ නගර සභාව**

2012 වර්ෂයේ වැඩසටහන් අයවැය ලේඛනය

කඩුවෙල මහ නගර සභාවේ 2012 වර්ෂය සඳහා වූ වැඩ සටහන් අයවැය ලේඛනය 2011 වර්ෂයේ ඔක්තෝබර් මස 28 වැනි දින සිට නොවැම්බර් මස 08 වැනි දින දක්වා (රජයේ නිවාඩු සහ ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ කඩුවෙල මහ නගර සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව 252 වැනි අධිකාරය වූ මහනගර සභා ආඥාපනතේ 212 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ජී. එච්. බුද්ධදාස,
නගරාධිපති.
කඩුවෙල මහ නගර සභාව.

2010 ඔක්තෝබර් මස 12 වැනි දින,
කඩුවෙල මහ නගර සභා කාර්යාලයේ දී ය.

10-583

---

**කළුතර නගර සභාව**

2012 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

තළුතර නගර සභාව විසින් 2011 සැප්තැම්බර් මස 20 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 6:1:1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2012 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් සෑම කාර්තුවක් තුලදී සමාන වාරික 4කින් නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ. 2012 වර්ෂය සඳහා පනවන සම්පූර්ණ වරිපනම් 2012 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද එක් එක් කාර්තුවට අදාළ වරිපනම් එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසාන දිනයට මත්තෙන් නගර සභාවට ගෙවනු ලැබුවහොත් සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

දේශකීර්ති අල්හාජ් එම්. එම්. එම්. ජවුෆර්,
සභාපති,
කළුතර නගර සභාව.

2011 ඔක්තෝබර් මස 03 වැනි දින.

***උපලේඛනය***

***යෝජනාව***

"255 වන අධිකාරය නගර සභා ආඥාපනතේ 166 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 වැනි අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 238 වැනි වගන්තියේ (1) උපවගන්තියෙන් නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කළුතර නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල ඉඩම් හා ගෙපත්වල 2009 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2012 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්,

එකී නගර සභා ආඥාපනතේ 160 වැනි වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වටිනාකමෙන්,

*(අ)* නේවාසික ස්ථාන මත සියයට තුනක (03%) වරිපනමක් ද සහ

*(ආ)* වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයට පහළොවක (15%)ක වරිපනමක් ද,

2012 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ ඒ වරිපනම් එකී නගර සභා ආඥාපනතේ 170 වැනි වගන්තිය සමග කියවිය යුතු ඉහත කී මහ නගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තියේ (02) වැනි උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ එක් එක් වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික 04කින් ගෙවීමට විධිවිධාන කිරීමටත් කළුතර නගර සභාව යෝජනා කර සිටින්නී ය.".

10-568

## වත්තල මාබෝල නගර සභාව

ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම සඳහන් වන අය විසින් ඔහුගේ නමට ඉදිරියෙන් සඳහන් කර ඇති ස්ථානයෙහි 2012.01.01 දින සිට 2012.12.31 වැනි දින දක්වා ගව/එළු ඝාතකාගාරයක් පවත්වාගෙන යෑම සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කර ඇති බවත්, මෙකී බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම්, තමා විරුද්ධත්වය දැක්වීමට හේතු විස්තර සහිතව පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මගින් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලේඛනගත තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතු බවට ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) අංක 7(2) වැනි වගන්තිය පරිදි මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ. එච්. එම්. නවුෂාඩ්,
සභාපති,
වත්තල මාබෝල නගර සභාව.

2011 ඔක්තෝබර් මස 12 වැනි දින,
වත්තල මාබෝල නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *ව්‍යාපාරය* | *ව්‍යාපාරය පවත්වන ස්ථානයේ ලිපිනය* |
|---|---|---|---|
| 01 | එම්. සී. එම්. සහබ්දීන් අංක 756, මීගමු පාර, මාබෝල වත්තල | ගව/එළු ඝාතකාගාරයක් පවත්වාගෙන යාම | අංක 41/12,දෙල්ගහවත්ත දූවවත්ත, මාබෝල, වත්තල |

10-613

---

## කුරුවිට ප්‍රාදේශීය සභාව

තහනමට ගත් දේපළ විකිණීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වරිපනම් බදු ගෙවීම පැහැර හැරීම නිසා චංචල දේපළ තහනමට ගැනීමට මවිසින් අත්සන් කර නිකුත් කරන්නට යෙදුන බලපත්‍රය යටතේ තහනමට ගෙන ඇති පහත උපලේඛනයේ දැක්වෙන චංචල දේපළ එකී පනතේ 163 වගන්තියේ විධිවිධාන අනුව 2011.01.31 දින පෙ.ව. 10.00ට කුරුවිට ප්‍රාදේශීය සභාවේ එල්ලාවල උප කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත දිනයේ නියමිත වේලාවට පෙර අදාල චංචල දේපළ හිමිකරු විසින් කුරුවිට ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු වන හිඟ වරිපනම් බදු සහ එකී පනතේ 161 වගන්තිය යටතේ ගෙවිය යුතුවන අතිරේක ගෙවීම් කුරුවිට ප්‍රාදේශීය සභාවට මුදලින් ගෙවා නිදහස් කර ගැනීමට අදාල දේපළ හිමියන් ක්‍රියා කළහොත් ඒ චංචල දේපළ මේ වෙන්දේසියේ විකිණීම නොකර ඉවත් කරන බව වැඩිදුරටත් නිවේදනය කරමි.

ජේ. එම්. පුෂ්පලතා,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

2011 ඔක්තෝබර් මස 13 වැනි දින,
කුරුවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| *අනු. අංකය* | *දේපළ හිමිකරුගේ නම හා ලිපිනය* | *වරිපනම් අංකය හා වීදිය* | *තහනමට ගත් දේපළ* |
|---|---|---|---|
| 01 | වී. වී. සෝමදාස තලාවිටිය. ඇහැලියගොඩ | (රත්නපුර පාර දකුණ) 340 සී | උස අඩි 3 හා පළල අඩි 1 1/2 ප්‍රමාණයේ මුහුනත වීදුරුව සහිත රතු පැහැති ශීතකරණය. |

10-672

# විවිධ දැන්වීම්

## බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

2012 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ අගෝස්තු මස 04 දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 07(ආ)II යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2012 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද, මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2012 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2012 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාල අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

එම්. කේ. කසුන්,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2011 සැප්තැම්බර් මස 07 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව,
බෙලිඅත්ත.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ —

*(අ)* හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2012 වර්ෂය සඳහා රුපියල් 10 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

*(ආ)* ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, 1989.02.03 දිනැති *ගැසට් පත්‍රයේ* IV(ආ) වැනි කොටසේ ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් 05කට අඩු වූ සෑම ඉඩමක් මත, 2012 වර්ෂය සඳහා රුපියල් 50 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

*(ඇ)* ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

10-547/2

---

## බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ 2012 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

2012 වර්ෂයේ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් අය කරනු ලබන ගාස්තු පැනවීමට අදාලව බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2011 අගෝස්තු මස 04 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී විෂයාංක 7(ආ) III යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. කේ. කසුන්,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2011 සැප්තැම්බර් මස 07 වැනි දින,
බෙලිඅත්ත.,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තියෙන් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බෙලිඅත්ත ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ 2012 වර්ෂයේ දී, මෙහි පහත උපලේඛනයේ නිරූපිත යම් කර්මාන්තයක් සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කර ගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම පහත I වැනි තීරුවේ සඳහන් සීමාවන් ඇතුළත වන අවස්ථාවක II වැනි තීරුවේ අනුරූප සටහනේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් පනවා අයකර ගත යුතු යැයි බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

*උපලේඛනය*

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| | *රු. ශත* |
| රු. 750 නොඉක්මවන අවස්ථාවක | 500 0 |
| රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | 750 0 |
| රු. 1,500 ඉක්මවන අවස්ථාවක | 1,000 0 |

1. තේ හෝ කෝපි කඩ
2. ආපනශාලා
3. බේකරි
4. පලතුරු විකිණීම
5. රසකැවිලි නිපදවීම/විකිණීම
6. මුද්‍රවන ලද කිරි වෙළඳාම
7. මාළු විකිණීම
8. මස් විකිණීම
9. හෝටල
10. බාබර් සාප්පු
11. ලොන්ඩ්‍රි
12. අයිස් කර්මාන්තශාලා
13. ගවගාල්

*අප්‍රසන්න වෙළඳාම :*

1. වාහන පින්තාරු කිරීම
2. කුකුළන්, ඌරන් ඇති කිරීම (මස් පිණිස/බිත්තර පිණිස)
3. හුණු පෝරණු
4. රබර් නිෂ්පාදනය කිරීම ගබඩා කිරීම
5. යෝගට් නිෂ්පාදනය
6. මල් ශාලාව

*අන්තරාදායක වෙළඳාම :*

1. ගෑස් අලෙවිය
2. විදුලි පෑස්සුම්වැඩ
3. ශීතකරණ අලුත්වැඩියාව

*අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම :*

1. ගරාජ්
2. යතුරු පැදි අලුත්වැඩියාව
3. වී මෝල

10-547/3

---

**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**

2012 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ අගෝස්තු මස 04 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 7(ආ) IV යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2012 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. කේ. කසුන්,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2011 සැප්තැම්බර් මස 07 වැනි දින,
බෙලිඅත්ත..
බෙලිඅත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ 11 වැනි තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2012 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2012 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්* | | |
|---|---|---|---|---|
| *අ.අ.* | *කර්මාන්තයේ ස්වභාවය* | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | සිල්ලර | 400 0 | 600 0 | 1,000 0 |
| 02. | සිල්ලර සහ සාප්පු බඩු | 500 0 | 750 0 | 1,000 0 |

| I වැනි තීරුව | | II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල් | | |
|---|---|---|---|---|
| අ.අ. | කර්මාන්තයේ ස්වභාවය | රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත |
| 03. | රෙදි පිළි සහ සාප්පු බඩු | 600 0 | 800 0 | 1,000 0 |
| 04. | ට්‍රැක්ටර් සහ වෙනත් කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර විකිණීම | 750 0 | 1,000 0 | 3,000 0 |
| 05. | වීදුරු ගබඩා කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | ප්ලාස්ටික් හා ඇළුමිනියම් භාණ්ඩ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | විසිතුරු මසුන් අලෙවිය | 350 0 | 550 0 | 700 0 |
| 08. | ඇස් කණ්නාඩි අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | කැසට්පට, වීඩියෝපට විකිණීම හා බදු දීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පාවහන් නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | රෙදිපිළි හා නිමි ඇඳුම් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | යතුරු පැදි විකිණීම | 750 0 | 1,500 0 | 3,000 0 |
| 14. | යතුරුපැදි අමතර කොටස් විකිණීම | 350 0 | 750 0 | 1,000 0 |
| 15. | යතුරුපැදි අලුත්වැඩියාව | 500 0 | 1,000 0 | 2,000 0 |
| 16. | ස්වර්ණාභරණ නිපදවීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | කොහු ආශ්‍රිත නිෂ්පාදන | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 18. | යාන්ත්‍රික පොල්තෙල් මෝල | 500 0 | 1,000 0 | 1,500 0 |
| 19. | මෝටර් රථ අමතර කොටස් | 500 0 | 1,000 0 | 3,000 0 |
| 20. | කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ෆයිබර් ග්ලාස් වැඩපළ | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ගඩොල් නිෂ්පාදනය හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | ලී වෙළඳසැල | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | ලී මෝල | 750 0 | 1,500 0 | 3,000 0 |
| 25. | පොල්කටු අඟුරු නිෂ්පාදනය, විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | පොල් ලී මඩු | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | තීන්ත හා වාර්නිෂ් | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | පුවත්පත් අලෙවිය | 500 0 | 600 0 | 800 0 |
| 29. | ගුවන් විදුලි රූපවාහිනී යන්ත්‍ර සහ අනෙකුත් විදුලි උපකරණ විකිණීම | 750 0 | 1,500 0 | 3,000 0 |
| 30. | ගුවන් විදුලි රූපවාහිනී යන්ත්‍ර සහ අනෙකුත් විදුලි උපකරණ අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | රටබීම හල | 1,800 0 | 2,000 0 | 3,000 0 |
| 32. | බටහිර බෙහෙත් ද්‍රව්‍ය විකිණීම (ෆාමසි) | 600 0 | 800 0 | 1,000 0 |
| 33. | ආයුර්වේද බෙහෙත් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | විසිතුරු භාණ්ඩ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | පොත්හල | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | ශබ්ද විකාශන යන්ත්‍ර බදු දීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | පැරණි යකඩ බඩු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | ඔරලෝසු විකිණීම සහ අළුත්වැඩියාව | 350 0 | 550 0 | 750 0 |
| 39. | හාඩ්වෙයාර් | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | කම්මල | 350 0 | 500 0 | 800 0 |
| 41. | ප්‍රචාරක දැන්වීම් නාම පුවරු සැකසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | සහල් විකිණීම | 250 0 | 350 0 | 400 0 |
| 43. | සුරුට්ටු දුම්කොළ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | පින්තූර රාමු කිරීම | 450 0 | 650 0 | 850 0 |
| 45. | ඡායා පිටපත් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | පරිගණක අලෙවිය හා අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | ප්ලාස්ටික් ස්ටිකර්, නාම පුවරු නිපදවීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | වඩු මඩු | 350 0 | 550 0 | 750 0 |
| 49. | සිසිල් බීම, පළතුරු බීම, අයිස්ක්‍රීම් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | පැළ තවාන් (විසිතුරු මල්පැළ සහ වෙනත් පැළ වර්ග) | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | එළවළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | සන්නිවේදන මධ්‍යස්ථාන/සන්නිවේදන සේවා | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | ලොතරැයි අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | ස්වයංසේවා වෙළඳසැල | 500 0 | 750 0 | 1,000 0 |

| අ.අ. | I වැනි තීරුව<br>කර්මාන්තයේ ස්වභාවය | II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්<br>රු. 750 නොඉක්මවන අවස්ථාවක නොඉක්මවන අවස්ථාවක<br>රු. ශත | <br>රු. 750 ඉක්මවන එහෙත් 1,500<br>රු. ශත | <br>රු. 1,500 ඉක්මවන අවස්ථාවක<br>රු. ශත |
|---|---|---|---|---|
| 55. | කුෂන් වැඩපළ | 350 0 | 550 0 | 750 0 |
| 56. | ඇඹරුම්හල | 400 0 | 600 0 | 800 0 |
| 57. | කොප්පරා නිපදවීම හා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | ග්‍රොසරි | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන වඩුමඩු | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | අභ්‍යාස පොත් නිෂ්පාදනය | 400 0 | 600 0 | 750 0 |
| 61. | පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | ටයර් ටියුබ් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | ටයර් ටියුබ් වෝල්කනයිසිං | 600 0 | 800 0 | 1,000 0 |
| 65. | ටයර් ටියුබ් අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | සුළු අපනයන භෝග වෙළඳාම | 350 0 | 550 0 | 750 0 |
| 67. | පිත්තල බඩු නිපදවීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 68. | පා පැදි විකිණීම සහ පා පැදි අමතර කොටස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 69. | පා පැදි අලුත්වැඩියාව | 300 0 | 450 0 | 700 0 |
| 70. | පුද්ගලික වෙළඳපොළ | 500 0 | 750 0 | 1,000 0 |
| 71. | ඡායාරූප ශාලාව | 500 0 | 750 0 | 1,000 0 |
| 72. | කොහුමෝල | 750 0 | 1,500 0 | 3,000 0 |
| 73. | කළුගල් වල | 750 0 | 1,500 0 | 3,000 0 |
| 74. | කළුගල් මෝල | 750 0 | 1,500 0 | 3,000 0 |
| 75. | පුද්ගලික ළදරු පාසල | 500 0 | 750 0 | 1,000 0 |
| 76. | තොග සහ සිල්ලර වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 77. | තොග වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 78. | ඉන්ධන ගබඩාකර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 79. | මැටි භාණ්ඩ නිපදවීම/විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 80. | සත්ත්ව ආහාර ගබඩා කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 81. | බීරළු, කැටයම් කැපීම | 500 0 | 750 0 | 1,000 0 |
| 82. | කොහු හෝ රබර් මෙට්ට නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 83. | තේ කොළ ඇසුරුම් කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 84. | පැණි හකුරු නිපදවීම/විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 85. | සමුපකාර ප්‍රාදේශික වෙළඳසැල | 500 0 | 750 0 | 1,000 0 |
| 86. | කළුගලින් සකසන ලද නාම පුවරු සමරු ඵලක සකස් කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 87. | රබර් සීල් කැපීම | 500 0 | 750 0 | 1,000 0 |
| 88. | බුලත්, පුවක්, හුණු, දුම්කොළ | 550 0 | 650 0 | 1,000 0 |
| 89. | අභ්‍යාස පොත්, පාසල් උපකරණ | 500 0 | 750 0 | 1,000 0 |
| 90. | තිර රෙදි මැසීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 91. | ලිහිසි තෙල් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 92. | සිමෙන්ති අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 93. | රෙදි පිළි විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 94. | බෑග් නිෂ්පාදනය හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 95. | පැණි හකුරු නිෂ්පාදනය හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 96. | ජංගම වෙළඳසැල | 500 0 | 750 0 | 1,000 0 |

10-547/4

---

**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**

2012 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ අගෝස්තු මස 04 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 7(ආ)V යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2012 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. කේ. කසුන්,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2011 සැප්තැම්බර් මස 07 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව,
බෙලිඅත්ත.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2012 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2012 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2012 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

***උපලේඛනය***

| | *I වැනි තීරුව*<br>*බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය* | *II වැනි තීරුව*<br>*ගෙවිය යුතු බද්ද*<br>*රු. ශත* |
|---|---|---|
| 1. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. | රු. 6,000 ඉක්මවන නමුත් 12,000 නොඉක්මවන විට | 90 0 |
| 3. | රු. 12,000 ඉක්මවන නමුත් 18,750 නොඉක්මවන විට | 180 0 |
| 4. | රු. 18,750 ඉක්මවන නමුත් 75,000 නොඉක්මවන විට | 360 0 |
| 5. | රු. 75,000 ඉක්මවන නමුත් 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| 6. | රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

1. පෞද්ගලික බෙහෙත් ශාලා (සිංහල)
2. පෞද්ගලික බෙහෙත් ශාලා (ඉංග්‍රීසි)
3. දන්ත චිකිත්සාගාර
4. වෛද්‍ය රසායනාගාර
5. විශේෂඥ වෛද්‍ය සේවය
6. රූපලාවන්‍ය ස්ථාන/මනාලියන් හැඩගැන්වීම
7. පරිගණක පන්ති
8. පෞද්ගලික පන්ති
9. රියැදුරු පුහුණුව
10. බැංකු
11. රක්ෂණ නියෝජිත ආයතන
12. මුද්‍රණාල
13. උකස් මධ්‍යස්ථාන
14. මූල්‍ය සමාගම්
15. රේස් ඔට්ටුපොළ
16. තුරඟ තරඟ මධ්‍යස්ථාන
17. උත්සව ශාලා බදු දීම
18. ඇඟළුම් කර්මාන්තශාලා
19. ටේලර් සාප්පු (ටකරන් මඩු, පුටු ඇතුළුව)
21. වාහන සේවා
22. තාර පිරිසැකසුම්.

10- 547/05

---

**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**

2012 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ අගෝස්තු මස 04 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 7(ආ) VI යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30ක් සම්පූර්ණ වූ වහාම 2012 වර්ෂය සඳහා වන මෙම බද්ද බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. කේ. කසුන්,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2011 සැප්තැම්බර් මස 07 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව,
බෙලිඅත්ත.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2012 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම, එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2012 වර්ෂය සඳහා පනවා අය කිරීමට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| | *රු. ශත* |
| 1. (i) මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක් | 25 0 |
| (ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා | |
| *(අ)* වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| *(ආ)* වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| (iii) සෑම ත්‍රි රෝද රථයක් සඳහා | 10 0 |
| (iv) සෑම කරත්තයක් සඳහා | 20 0 |
| (v) සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| (vi) සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| (vii) සෑම ඇතෙකු සඳහා | 50 0 |

2. රෝදවල විෂ්කම්භය අඟල් 26ට නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත, වෙළඳ කටයුතු සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීම්වලින් නිදහස් කෙරේ.

10-547/6

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

බලපත්‍ර ගාස්තු පැනවීම - 2012 වර්ෂය

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ අගෝස්තු මස 30 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 5-9-3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහ ජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි පළවන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2012 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ දෙවැනි තීරුවේ අනුරූපී සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි මෙයින් දැනුම් දෙනු ලැබේ.

යූ. කේ. සුමිත් වීරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2011 ඔක්තෝබර් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ දී ය.

| *බලපත්‍රයේ ස්වභාවය* | *රු. 750 ට නොවැඩි* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 ට නොවැඩි* | *රු. 1,500 ට වැඩි* |
|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. කෘෂි ද්‍රව්‍ය ගබඩා කර තැබීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. පෙට්‍රල්/භූමිතෙල්/ඩීසල් ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. ඩීසල්/භූමිතෙල් ප්‍රවාහනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. අවමංගල්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. කොප්පරා මැස්සක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. දුම්කොළ ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| බලපත්‍රයේ ස්වභාවය | රු. 750 ට නොවැඩි | රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 ට නොවැඩි | රු. 1,500 ට වැඩි |
|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත |
| 07. අඟුරු වලක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 1,000 0 |
| 08. කොහු හෝ කොහු ආශ්‍රිත නිෂ්පාදන ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. දුම්කොළ වේලීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. ගෑස් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. පොල් ලී පැලීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. දුම්කොළ වේලා කුඩුකරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. මට්ටවලක් පවත්වාගෙන යාම (පොල් ලෙලි) | 500 0 | 750 0 | 1,000 0 |
| 14. සිමෙන්ති ගබඩා කිරීම හා අලෙවි කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. ගෝ ඝාතකාගාරයක් පැවැත්වීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. හුණු පිළිස්සීමට පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. ගිනිකෙළි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 1,000 0 |
| 18. ගම්බද බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 750 0 |
| 19. නගරබද බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 1,000 0 |
| 21. කළුගල් කැඩීම හා ගල් වලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. විද්‍යුත් ලෝහ ආලේප කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. විදුලි කාර්මික වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. ජී. අයි. තහඩුවලින් උපකරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. ඇළුමිනියම් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම සමග මෝටර් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. සම් නිෂ්පාදන වැඩපලක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 1,000 0 |
| 29. කම්හලක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 1,000 0 |
| 30. රබර් සම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 1,000 0 |
| 31. වී කෙටීමේ මෝලක් පවත්වාගෙන යාම (ඇඹරුම් හලක්- මිරිස්) | 400 0 | 600 0 | 1,000 0 |
| 32. බැටරි වතුර නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 1,000 0 |
| 33. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීමේ මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. රට බීම හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. මිතිරන් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. හුණු ඇඹරීමේ මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. හුණු පැකට් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. ගව මස් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. එළු මස් කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 1,000 0 |
| 40. කුකුල් මස් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. ඌරු මස් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. අලුත් මාළු (කරදිය) මිරිදිය) කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. බිත්තර පිණිස කිකිළියන්/මස් පිණිස 500ට වැඩි ප්‍රමාණයක් ඇතිකරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 1,000 0 |
| 44. බැටළුවන් ඇතිකරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 1,000 0 |
| 45. කිරිපට්ටියක් හෝ ගව ගාලක් පවත්වාගෙන යාම | 400 0 | 750 0 | 1,000 0 |
| 46. එළුවන් 05ට වැඩි ප්‍රමාණයක් ඇතිකරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 750 0 |
| 47. සත්ත්ව ආහාර ගබඩා කිරීමේ අලෙවි සලක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 1,000 0 |
| 48. කරවල, ලුණු, මාළු, ජාඩි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 1,000 0 |
| 49. ගව මස් ප්‍රවාහනය කිරීම | 400 0 | 500 0 | 1,000 0 |
| 50. මත්ස්‍ය ගොවිපලක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 1,000 0 |
| 51. රබර් සම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 750 0 |
| 52. යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 750 0 | 1,000 0 |
| 53. පොල්තෙල් හිඳින ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 750 0 |
| 54. පොල්තෙල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. ගඩොල් නිෂ්පදනය හා ගඩොල් විකිණීම සඳහා ගබඩා කර තැබීම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. වැලි ගොඩ දැමීමේ මංකඩක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. හතු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. දැව ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| බලපත්‍රයේ ස්වභාවය | රු. 750 ට නොවැඩි<br>රු. ශත | රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 ට නොවැඩි<br>රු. ශත | රු. 1,500 ට වැඩි<br>රු. ශත |
|---|---|---|---|
| 59. පානීය ජලය බෝතල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. දියලුණු පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 62. රසකැවිලි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 1,000 0 |
| 63. අයිස්ක්‍රීම් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 1,000 0 |
| 64. පපඩම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 1,000 0 |
| 65. විනාකිරි නිපදවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 1,000 0 |
| 66. යෝගට් නිපදවීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 1,000 0 |
| 67. හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 68. බත් කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 750 0 | 900 0 |
| 69. ආපන ශාලාවක් පවත්වාගෙන යාම | 400 0 | 750 0 | 900 0 |
| 70. ගම්බද තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 750 0 |
| 71. නගරබද තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 700 0 | 900 0 |
| 72. කුළුබඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 1,000 0 |
| 73. එළවළු වෙළෙඳ සලක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 750 0 |
| 74. එළවළු තොග වෙළෙඳ සලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 75. තොග බඩු ගබඩාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 76. විසිතුරු සංචාරක කරදිය/මිරිදිය මසුන් වෙළෙඳාම | 400 0 | 500 0 | 1,000 0 |
| 77. කිරිපැණි කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 1,000 0 |
| 78. පැකට් බීම වර්ග තොග වශයෙන් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 1,000 0 |
| 79. ධාන්‍ය වර්ග ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| 80. පොල්තෙල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 1,000 0 |
| 81. පළතුරු විකිණීම සඳහා කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 1,000 0 |
| 82. ඉංග්‍රීසි බෙහෙත් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 83. පාපැදි/යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 750 0 |
| 84. මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙනයාම | 400 0 | 550 0 | 1,000 0 |
| 85. මෝටර් රථ ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 86. කොන්ක්‍රීට් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 87. සිමෙන්ති භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 88. යන්ත්‍රානුසාරයෙන් මිරිස් කෙටීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 780 0 |
| 89. සබන් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 90. රූපලාවන්‍ය හා මනාලියන් හැඩ ගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 750 0 |
| 91. කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 92. කලුගල් කුට්ටි කඩා ආනයනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
